කොරළෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

-------------------------

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015ජුනි 29 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015අගොස්තු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොරළෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

-----------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසිපරිදි පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරන අඩුපාඩු

-----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 13,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.3 ලැබියයුතු ගිණුම්

-------------------

සේවය හැර ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවියයුතු හිඟ ණය ශේෂය වන රු. 226,977 ක් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර 2011 වසරේ සිට දිගටම ගිණුම් ප්‍රකාශන වලට ගෙනවිත් තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයක් ඉදිරියේ දක්වා තිබෙන සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | සාක්ෂි නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| ඉඩම් ගොඩනැගිලි | 81,562,259 | ඉඩම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 577,500 | ස්ථාවර වත්කම් ලේඛන |
| ලීබඩු හා සවිකිරීම | 650,793 | |
| පුස්තකාල පොත් | 632,482 | |
| පරිඝණක | 199,649 | |
| ඡායාරූප ගන්නා උපකරණ | 24500 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ශනය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල් හා ගබඩා ද්‍රව්‍ය යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය X වගන්තිය 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනය කර විචලනයන් සඳහා හේතු දක්වන විස්තර ප්‍රකාශනයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 2,415,575 ක් වූ අතර, එය සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 5,419,091 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලෙයෙහි රු. 3,003,516 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍ය සාධනය

-------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන්ඇස්තමේන්තුගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර සැලකියයුතු විචලනයක් නිරීක්ෂණයවිය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | අයකළ ආදායම් | විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ------------------ | ---------------- | -------- | ---------- | ---------- |
| | රු.000 | රු.000 | රු.000 | % |
| වරිපනම් | 625 | 2 | 623 | 99 |
| බදු | 800 | 416 | 384 | 48 |
| සේවා ගාස්තු | 285 | 60 | 225 | 78 |
| වරෙන්තු ගාස්තු සහ දඩමුදල් | 3,775 | 3,117 | 658 | 17 |
| වෙනත් ආදායම් | 1,708 | 1,110 | 598 | 35 |

2.2.2 වරිපනම් හා බදු
-----------------

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම්,ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි සඳහා වරිපනම්බදු අයකිරීම් සඳහා තක්සේරු දෙපාර්තුමෙන්තුව මගින් වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමේ කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව රු. 500,000 ක පමණ සභාවට අහිමිවී තිබුණි.

2.2.3 සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම්
-----------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීමට නොහැකිවීමේ හේතුවෙන් සහා බලප්‍රදේශයේ පුද්ගලික සන්නිවේදන ආයතනවලින් ස්ථාපිත කර තිබූ සන්නිවේදක කුළුනු 06 ක් සඳහා ස්ථාපිත බලපත්‍ර ගාස්තු අයකරගත නොහැකි බැවින් සභාව වාර්ෂිකව රු. 500,000 ක් පමණ ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.4 ගොඩනැගිලි කුලි

-------------------

සභාව විසින් මහජන බැංකුවට බදු දී තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් 2009 වර්ෂයේ සිට අයවියයුතු රු. 500,000 ක බදු මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ලංකා බැංකුවෙ ආරම්භකරන ලද ජංගම ගිණුම් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් ක්‍රියාත්මකවී (Domant) නොතිබුනද, මෙම ගිණුම් වසා දමා එහි තිබෙන රු. 117,714 ක ශේෂය වෙනත් ගිණුමකට මාරුකිරීමට සභාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ දහයකට ප්‍රථම වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමෙන්තුවලින් සභාව වෙත භාර දී තිබූ මෝටර් වාහන 15 ක වටිනාකම් තක්සේරුකර ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 22% සිට 80% දක්වා විචලනයක් නිරීක්ණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) අයවැය පාලනය